# ශ්‍රී ලාංකික විවාහ සංස්ථාවේ මෑතකාලීන ප්‍රවනතා පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් (මාතර දිස්ත්‍රික්කය ඇසුරිනි)

නදීරා සරෝජනී පයතුංග,
සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

විවාහ සංස්ථාව අනාදිමත් කාලයක සිට විශ්වාසයන් හෝ ආවේනික සම්ප්‍රදායන් මුල් කර ගත් ප්‍රාථමික ලක්ෂණ වලින් පැවතාව, පසුකාලීනව නෛතික බැඳීම් වලින් යුතුව මිනිස් වර්ගයාගේ පැවැත්ම උදෙසා ලෝකයේ සෑම සමාජයකම විවිධ අයුරින් බිහි වී ඇති මූලික සංස්ථාවකි. සමාජයේ ජීවත් වන සෑම ගැහැණියකගේ හෝ පුරුෂයකුගේ වැදගත් අවතරණ අවස්ථාවක් ලෙසද පෙන්වා දිය හැක. සමාජයක පැවැත්ම සඳහා අවශ්‍ය කරණ පුද්ගලයන් එම සමාජයට හඳුන්වා දෙනු ලබන විධිමත් මාධ්‍ය ලෙස විවාහය ලෝකයේ සෑම සමාජයකම හඳුනාගත හැකිය. පුද්ගලයන් නොමැතිව සමාජයක් බිහි නොවන අතර එම සමාජය නිර්මාණය කරනු ලබන එකම ආයතනය ලෙසද විවාහ සංස්ථාව පෙන්වාදිය හැක. සමාජයේ වෙසෙන බහුතරය විසින් හොඳයයි සම්මත කර ගත් මෙම මාධ්‍ය තුලින් සමාජයට පුද්ගලයන් අඛණ්ඩව හඳුන්වා දීමක් සිදු කෙරෙනු ලැබේ. අතීතයේ පටන් පැවැත එන සම්ප්‍රදායික විවාහ ක්‍රමය ඉතාමත් සරල: චාරිත්‍ර වාරිත්‍රවලින් යුතු ප්‍රීතිමත් විවාහ ක්‍රමයක් ලෙස පැවත ආවද නූතනය වන විට සමාජය විවිධ වෙනස්වීම්වලට භාජනයවී ඇති හෙයින් විවාහ සංස්ථාව ද වෙනස්වීමේ ප්‍රවනතාවයට නතුවී ඇති බව කිව යුතුය. සාම්ප්‍රදායික පවුල් ව්‍යුහයේ පුද්ගලයාගේ විවාහය වූ කලී ස්ත්‍රියක් හා පුරුෂයකු එකතු කළ ක්‍රියාවක් නොවේ. එය එක් සමූහයක් තවත් සමූහයක් මුණගැස්වීමේ ක්‍රියාවලියකි. නමුත් නූතන සමාජය තුළ විවාහය පුද්ගල දිශානතියකට යොමු වී තිබේ. එසේම සහකරු සහකාරිය තෝරා ගැනීම නූතන තාක්ෂණයේ දියුණුවක් සමග විද්‍යා තාක්ෂණික, පරිගණක යන්ත්‍රවලට භාර කර ඇත. විවාහ චාරිත්‍ර වාරිත්‍ර බොහොමයක් බටහිර නැඹුරුවක් ගත් ඒවා වේ. මෙවැනි සුවිශේෂී වෙනස්කම් ඔස්සේ අප සමාජයට වෙනස් සමාජ සංස්කෘතීන්වල පවතින අංගෝපාංගයන් තමන්ගේ බවට පත්කරගෙන සාම්ප්‍රදායික විවාහයේ සියළු අංශයන් වෙනසකට භාජනය කර ඇත. මෙසේ ලාංකික විවාහ සංස්ථාව වෙත බොහෝ නව ප්‍රවනතාවයන් නිර්මාණය වීමට නාගරීකරණය, බටහිරකරණය, දියුණු සන්නිවේදන ක්‍රම, නිදහස් අධ්‍යාපනය සහ 1977 න් පසු විවෘත ආර්ථික ක්‍රමයද මේ සඳහා බලපා ඇති ප්‍රබල සාධකයන් බව කිවයුතු වේ.